# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 මාර්තු**
**වෙළුම 02 නිකුතුව 03**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2020 මාර්තු මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 656 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 42.3 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

2020 මාර්තු මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,205 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 30.3 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)




2020 වසරේ පළමු කාර්තුව තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 16.0 කින් පහළ ගිය අතර ආනයන වියදම ද සියයට 6.5 කින් පහළ ගියේය.

වෙළඳ හිඟය 2019 මාර්තු මාසයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 592 ට සාපේක්ෂව 2020 මාර්තු මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 549 දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2020 ජන. - මාර්තු)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)




### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)



# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - මාර්තු)




### අපනයන පරිමා දර්ශකය - (ජන. - මාර්තු)




සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුව තුළ දී අපනයන ආදායම පහත වැටුණි.

සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමා පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුව තුළ දී අපනයන පරිමා දර්ශකය පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මාර්තු)




### තේ සහ රබර් මිල ගණන් *




*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ

2020 වසරේ පළමු කාර්තුව තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණු අතර තේ, කුළුබඩු, මුහුදු ආහාර සහ පොල් අපනයන පහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, සුළු කාෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම මෙම කාලපරිච්ඡේදය තුළදී ඉහළ ගියේය.

# කාර්මික අපනයන

කාර්මික අපනයන ආදායම




කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මාර්තු)




නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2020 වසරේ පළමු කාර්තුවේ දී කාර්මික අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම පහළ යෑම එයට හේතු විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් නැව් සඳහා වන ඉන්ධන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - මාර්තු)




ආනයන පරිමා දර්ශකය (ජන. - මාර්තු)




2020 වසරේ පළමු කාර්තුවේ දී ආනයන වියදම පහත වැටුණු අතර අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පහත වැටීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආනයන පරිමා දර්ශකය සුළු වශයෙන් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන

### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මාර්තු)




### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්




විශේෂයෙන්, එළවළු, සීනි හා රසකැවිලි සහ කිරි නිෂ්පාදිත වැනි ආහාර ද්‍රව්‍ය ඇතුළු බොහෝ කාණ්ඩවල ආනයන ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුවේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වෙතත් මෙම කාලපරිච්ඡේදය තුළ දී මුහුදු ආහාර, පෞද්ගලික රථවාහන සහ විදුලි සංදේශ මෙවලම් ආනයන වියදම පහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන

### අන්තර් භාණ්ඩ ආනයන වියදම




### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - මාර්තු)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ මූල ලෝහ ආනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුවේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර සැකසුම් සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය

ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - මාර්තු)




ප්‍රවාහන උපකරණ ආනයන ඉහළ යෑම හමුවේ වුවද ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුවේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මාර්තු- 19 | මාර්තු - 20 | වෙනස (%) | ජන. - මාර්තු 2019 | ජන. - මාර්තු 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **232.3** | **122.7** | **-47.2** | **647.7** | **506.5** | **-21.8** |
| එයින් | තේ | 125.9 | 62.5 | -50.3 | 347.2 | 270.1 | -22.2 |
| | පොල් | 34.8 | 19.7 | -43.4 | 87.8 | 70.4 | -19.8 |
| | කුළුබඩු | 24.2 | 12.9 | -46.6 | 80.6 | 51.0 | -36.7 |
| | මුහුදු ආහාර | 28.2 | 12.8 | -54.8 | 80.9 | 57.0 | -29.6 |
| **කාර්මික අපනයන** | | **898.4** | **531.5** | **-40.8** | **2,494.3** | **2,134.1** | **-14.4** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 532.7 | 312.7 | -41.3 | 1,474.2 | 1,254.9 | -14.9 |
| | රබර් නිෂ්පාදිත | 82.6 | 54.5 | -34.1 | 233.0 | 196.2 | -15.8 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 48.0 | 37.0 | -22.9 | 124.0 | 177.7 | 43.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 47.3 | 38.1 | -19.3 | 135.9 | 110.3 | -18.9 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 39.0 | 21.1 | -45.8 | 108.0 | 86.4 | -20.0 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 32.1 | 8.6 | -73.3 | 83.3 | 54.6 | -34.5 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.6 | 3.7 | -61.4 | 33.2 | 16.6 | -50.1 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **6.2** | **2.2** | **-64.7** | **14.1** | **9.1** | **-35.7** |
| **මුළු අපනයන** | | **1,136.9** | **656.4** | **-42.3** | **3,156.1** | **2,649.7** | **-16.0** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මාර්තු- 19 | මාර්තු - 20 | වෙනස (%) | ජන. - මාර්තු 2019 | ජන. - මාර්තු 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **351.9** | **267.1** | **267.1** | **912.3** | **966.1** | **5.9** |
| **ආහාර හා පාන වර්ග** | | 138.0 | 143.0 | 143.0 | 334.9 | 426.4 | 27.3 |
| එයින් | සහල් | 1.0 | 1.0 | 1.0 | 4.3 | 4.6 | 7.0 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 213.8 | 124.0 | 124.0 | 577.4 | 539.7 | -6.5 |
| එයින් | පෞද්ගලික රථවාහන | 72.2 | 39.5 | 39.5 | 169.8 | 156.4 | -7.9 |
| **අන්තර් භාණ්ඩ** | | **987.1** | **699.7** | **699.7** | **2,774.2** | **2,545.7** | **-8.2** |
| එයින් | ඉන්ධන | 407.9 | 237.7 | 237.7 | 1,018.6 | 948.2 | -6.9 |
| | රත්‍රන් | 0.0 | 0.0 | 0.0 | 0.8 | 0.2 | -76.4 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 213.9 | 139.3 | 139.3 | 688.6 | 622.0 | -9.7 |
| | පොහොර | 39.3 | 6.7 | 6.7 | 48.4 | 25.9 | -46.5 |
| | තිරිඟු හා ඉරිඟු | 12.0 | 62.5 | 62.5 | 53.2 | 79.8 | 49.9 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **390.1** | **238.2** | **238.2** | **1,130.4** | **990.9** | **-12.3** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 213.9 | 130.2 | 130.2 | 639.0 | 572.4 | -10.4 |
| **මුළු ආනයන** | | **1,729.0** | **1,205.0** | **1,205.0** | **4,816.9** | **4,502.7** | **-6.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මාර්තු- 19 | මාර්තු - 20 | වෙනස (%) | ජන. - මාර්තු 2019 | ජන. - මාර්තු 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -592.2 | -548.7 | | -1,660.8 | -1,853.0 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | මාර්තු- 19 | මාර්තු - 20 | වෙනස (%) | ජන. - මාර්තු 2019 | ජන. - මාර්තු 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 158.2 | 93.3 | -41.0 | 146.4 | 123.6 | -15.6 |
| | පරිමා දර්ශකය | 195.2 | 107.3 | -45.1 | 156.2 | 130.5 | -16.4 |
| | මිල දර්ශකය | 81.1 | 87.0 | 7.3 | 93.7 | 94.7 | 1.0 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 154.7 | 107.8 | -30.3 | 143.7 | 134.3 | -6.5 |
| | පරිමා දර්ශකය | 170.8 | 139.4 | -18.4 | 158.4 | 156.6 | -1.1 |
| | මිල දර්ශකය | 90.6 | 77.4 | -14.6 | 90.7 | 85.8 | -5.5 |
| **වෙළඳ මිල අනුපාතය** | | 89.5 | 112.4 | 25.7 | 103.3 | 110.4 | 6.8 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද